# ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීම සහ ආගමික සාධකයේ බලපෑම

ඒ. ජේ. එම්. සී. ජේ. වත්සලා කරුණාසේන[1]

ප්‍රජාතන්ත්‍රවාදය යනු ජනතාව විසින් ජනතාව උදෙසා ක්‍රියාවට නංවනු ලබන ජනතාවගේ පාලනයයි. දේශපාලන සහභාගීත්වය ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය අංගයක් වේ. ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදය වැළඳ ගනු ලබන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිතවාදයේ ප්‍රතිඵලයක් වශයෙනි. මුල් කාලීනව යම්තාක් දුරකට ප්‍රජාතන්ත්‍රවාදයෙන් සාර්ථකත්වයක් ළඟා කර ගැනීමට සමත් වුවත් 1970 දශකයෙන් පසු ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය අර්බුදයකට ගමන් කරනන්නට විය. වර්තමාන ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමයේ දක්නට ඇති සුවිශේෂී තත්ත්වයක් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ සුරක්ෂිතබාවය උදෙසා උදාසීන හා අවම ජනතා සහභාගීත්වයක් පැවතීමයි. එයට 18 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, නිදහස් ජන මාධ්‍ය, අගවිනිසුරුට එරෙහි දෝශාභියෝගය, 13වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම පිළිබඳ කතිකාවත අදි අවස්ථාවන් පෙන්වා දිය හැක. නමුත් බහුවිධ සමාජ ක්‍රමයක් වන ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමය තුළ ආගමික සාධකය වෙනුවෙන් වර්තමානයේ දී ඉහළ දේශපාලන සහභාගීත්වයක් නිරූපණයවේ. එහි දී බෞද්ධ ආගම සහ ඉස්ලාම් ආගම ප්‍රධාන වේ. මීට 2600 වන සම්බුද්ධත්ව ජයන්ති සැමරුම, කපිල වස්තු ධාතු ප්‍රදර්ශනය, හලාල් විරෝධී ව්‍යාපාරය, අලුත්ගම සිංහල මුස්ලිම් ගැටුම ආදී අවස්ථා උදාහරණ සපයයි. මෙම තත්ත්වයට දේශපාලන හා දේශපාලන නොවන සංවිධානයන්ගේ ක්‍රියාකාරීත්වය ඍජුව හා වක්‍ර ආකාරයෙන් බලපා ඇත. එබැවින් මෙම ගැටලුකාරී තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම ඉතා වැදගත් විය. ඒ අනුව මෙම පර්යේෂණය සිදු කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීක මූලාශ්‍ර ආශ්‍රයෙන් ලබා ගන්නා ලද තොරතුරු පරිහරණය කරන ලදී. බහුත්වවාදී ක්‍රමවේදයක් මත පදනම් වෙමින් ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා අශ්‍රයෙන් ලබාගත් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්තයන් විශ්ලේෂණයට ලක් කළ අතර මෙම අධ්‍යයනය විවිධ සීමාවන්ට යටත්ව සිදු විය. එහිදී සමස්ත සමාජයම නියදිය වශයෙන් ගෙන පර්යේෂණයට ලක් කිරීමට නොහැකි විය. තවද අධ්‍යාපන මට්ටමෙන් සීමා වූ අතර සෑම ආගමක් පිළිබඳවම අධ්‍යයනයට ලක් කිරීමට ද නොහැකි විය. නමුත් අවසාන වශයෙන් අවම දේශපාලන සංස්කෘතිය, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ජනතාවගේ පවතින අවම දැනුවත් බාවය, ආගම සහ ජනතාව අතර පවතින සමීප සබඳතාවය, දේශපාලන පක්ෂ බලපෑම් කණ්ඩායම් හා ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය ආදී තත්ත්වයන් මෙම ගැටලුකාරී තත්ත්වය කෙරෙහි අඩු වැඩි වශයෙන් බලපා ඇති බව නිගමනය කළ හැකි විය. එසේම ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන් සුරක්ෂිත කිරීම වෙනුවෙන් පෙනී සිටිනවාට වඩා ආගමික සාධක කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්වන්නේ ඇයි, ආගමික සාධකය හා දේශපාලනය අතර පවතින සබඳතාවය, දේශපාලනයට ආගමෙන් වන බලපෑම, වත්මන් දේශපාලන ක්‍රමය තුළ ආගමික සාධකයේ ස්වරූපය යනාදී අරමුණු සාධනය කර ගැනීමට ද මෙමඟින් අවස්ථාව උදා විය.

**ප්‍රමුඛ පද :-** ප්‍රජාතන්ත්‍රවාදය, දේශපාලන සහභාගීත්වය, බෞද්ධ ආගම, ඉස්ලාම් ආගම

---

1 තාවකාලික නිබන්ධක, දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
Jeewabeykoon@gmail.com